# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2348/42 – 2023 සැප්තැම්බර් මස 08 වැනි සිකුරාදා – 2023.09.08**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක: IR/COM/04/2017/54-i.
IR/COM/04/2017/219.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.11.07 දිනැති හා අංක 2305/08 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.10.31 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නෙළුව, දනවල හි පදිංචි ජයන්ත තිරාණගම මයා ඇතුළු සේවක පිරිස සහ බත්තරමුල්ල, දෙවන අදියර, සෙත්සිරිපාය, 8 වන මහල හි පිහිටි තේ ශක්ති අරමුදල අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 71/2022 හා 2023.08.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 24 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 40280 – 11(2023/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය - කොළඹ.

*නඩු අංකය:* A /71/2022.

IR/COM/04/2017/54-i.
IR/COM/04/2017/219.

ජයන්ත තිරාණගම මයා ඇතුළු,
සේවක පිරිස,
දනවල,
නෙළුව,

*පැමිණිලිකරු*

එදිරිව

තේශක්ති අරමුදල,
8 වන මහල,
සෙත්සිරිපාය,
දෙවන අදියර,
බත්තරමුල්ල.

*වගඋත්තරකරු*

ප්‍රදානයයි

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ ඃ

''තේ ශක්ති අරමුදල සතු කම්හල් වසා දැමීමේ හේතුව මත තේ ශක්ති අරමුදලේ සේවය කළ ජයන්ත තිරාණගම මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 08 දෙනාගේ සේවය 2016.12.31 දින සිට අවසන් කිරීමේදී වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව තිබියදී විශ්‍රාම යැවීමේ වයස අවුරුදු 55 ලෙස සලකා වන්දි ගණනය කිරීම මගින් අසාධාරණයක් සිදු වී තිබේද? එසේ සිදු වී තිබේ නම් ඔවුනට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.''

01. ජයන්ත තිරාණගම
02. ඒ. ඩබ්. කුමාරසිරි
03. එම්. පී. නීතා රත්නකුමාරි
04. එම්. කේ. අනුර සරත් කුමාර
05. පසන් වටවල
06. ප්‍රියන්ත බාලපටබැඳි
07. ඩබ්. එම්. ධර්මසිරි
08. ඩබ්. ඩබ්. සී. සී. කුමාර

මෙම නඩුව ප්‍රථම වරට 2022.11.15 දින කැඳ වූ අතර එහිදී පැමිණිලිකාර පාර්ශ්වයේ නියෝජිත බන්දුල ගමගේ මහතා ප්‍රකාශ කර සිටියේ මෙම නඩුව A/43/2019, A/13/2020, A/65/2020, A/19/2021 යන නඩු අංක යටතේ විභාග කිරීමට යොදා තිබුනද ඒ සියළුම නඩු ගොනු මේ වන විට අවලංගු කර නැවත A/71/2022 නඩුව යටතේ මෙම පැමිණිල්ල විභාගයට ගෙන ඇති බවය. ඒ අනුව මීට ඉහත නඩු අංක A/43/2019 හි අවසන් වරට ලබාදුන් ලිඛිත ප්‍රකාශයන් හැර අනෙකුත් සියලුම ලේඛන සහ සාක්ෂි වගඋත්තරකාර පාර්ශ්වයට ලබාදීම සම්බන්ධයෙන් විරෝධතාවයක් නොමැති බවය. මෙහිදී දෙවන පාර්ශ්වය සඳහන් කර සිටියේ, තේ ශක්ති අරමුදල අවශ්‍ය නීති උපදෙස් ලබා ගෙන ආයතනයේ ස්ථාවරය පිළිබඳව දැනුවත් කිරීමට ඉදිරි දිනයක් ලබා දෙන ලෙසය.

ඒ අනුව මෙම නඩුව නැවතත් 2022.12.01 දින කැඳ වූ අවස්ථාවේදී පළමු පාර්ශ්වය විසින් තම ස්ථාවරය ලිඛිතව ඉදිරිපත් කරනු ලැබූ අතර දෙවන පාර්ශ්වය විසින් ඒ සඳහා තව දුරටත් කාලය ඉල්ලා සිටින ලදී. ඒ අනුව මෙම නඩුව 2023.01.23 දක්වා කල් තබන ලදී.

2023.01.23 දින මෙම නඩුව නැවත කැඳ වූ අවස්ථාවේදී තම ලිඛිත දේශන පිටපත් තුනකින් ඉදිරිපත් නොකර තිබූ බැවින්, අධිකරණය නියෝග කලේ නියමිත පිටපත් සංඛ්‍යාවක් සමඟ තම ලිඛිත දේශන 2023.01.31 දිනට ප්‍රථම බේරුම්කරණ අංශයට ඉදිරිපත් කරන ලෙසය.

නැවත 2023.03.23 දින මෙම නඩුව කැඳ වූ අතර දෙපාර්ශ්වය විසින්ම තම ලිඛිත දේශන පිටපත් තුනකින් නියමිත දිනට බේරුම්කරණ අංශයට ඉදිරිපත් කර තිබුනි. පළමු පාර්ශ්වයේ නියෝජිත බන්දුල ගමගේ මහතා එදින කියා සිටියේ එක් පැමිණිලිකරුවෙක් වන ඩබ්. එම්. ධර්මසිරි මහතා අසනීප තත්ත්වයෙන් පසුවන බැවින් ඔහුව නියෝජනය කරමින් ඔහුගේ දියණිය වන ඩබ්. එම්. ධනන්ජනී මහත්මිය පෙනී සිටින බවයි. මීට අමතරව තවත් පැමිණිලිකරුවෙක් වන ඩබ්. ඩබ්. සී. සී. කුමාර යන අය දැනටමත් මිය ගොස් ඇති බැවින් ඔහු වෙනුවෙන් ආදේශකයෙක් ලෙස ඔහුගේ බිරිඳ පෙනී සිටින බවත් විධිමත් ලෙස මීළඟ නඩු දිනයේ දී එකී ආදේශය සිදු කිරීමට බලාපොරොත්තු වන බවත්ය.

එහිදි දෙවන පාර්ශ්වයේ නීතීඥ ෂබ්නා රෆීක් මහත්මිය ප්‍රකාශ කර සිටියේ මෙම නඩුව කැඳ වූ මුල් දින සිටම ඩබ්. එම්. ධනන්ජනී මහත්මිය තම පියා වෙනුවෙන් පෙනී සිටියත්, පියා සම්බන්ධව වෛද්‍ය වාර්තාවක් හෝ ඇයට බලය පැවරීමේ ලිපියක් මේ දක්වා අධිකරණයට ඉදිරිපත් කර නොමැති නිසා මීළඟ නඩු දිනයට ප්‍රථම ඩබ්. එම්. ධර්මසිරි මහතාගේ සෞඛ්‍යය තත්වය පිළිබඳව වෛද්‍ය වාර්තාවක් සහ ඔහු වෙනුවෙන් දියණියට, මෙම නඩුවට පෙනී සිටීම සඳහා බලය පැවරීමේ ලිපියක් ඉදිරිපත් කරන ලෙසය. එය අධිකරණය පිළිගත් අතර පළමු පාර්ශ්වයට දන්වා සිටියේ මීළඟ නඩු දිනයේදී එම වෛද්‍ය වාර්තාව සහ බලය පැවරීමේ ලිපිය ඉදිරිපත් කරන ලෙසය. තවද දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කළ ලිඛිත දේශන සැලකිල්ලට ගත් අධිකරණය , මෙම අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ ක්‍රමය තේ ශක්ති අරමුදලට හඳුන්වා දීමට ප්‍රථම තම සේවකයින්ගේ විශ්‍රාම වයස අවුරුදු 55 බවට තීන්දු කිරීමට අදාළව සාක්ෂි ඉදිරිපත් කරන ලෙසත්, එමෙන්ම මෙම නඩුවට සම්බන්ධ අට දෙනාගේම සහතික කරන ලද පත්වීම් ලිපිවල පිටපත් අධිකරණයට ඉදිරිපත් කරන ලෙසත් දෙපාර්ශ්වයටම නියෝග කරන ලදී.

නැවතත් 2023.04.10 දින මෙම නඩුව කැඳ වූ අතර එහිදි පළමු පාර්ශ්වය විසින් ඩබ්. එම්. ධර්මසිරි මහතාගේ වෛද්‍ය වාර්තාව ඉදිරිපත් කළ අතර දියණිය වන ඩබ්. එම්. ධනන්ජනී මහත්මියට බලය පැවරීමේ ඇටෝර්නි බලපත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බවත්, තවමත් එය සහතික කර දී නොමැති බවත් මීළඟ නඩු දිනයේදී විධිමත් ලෙස සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය ඉදිරිපත් කරන බව ප්‍රකාශ කර සිටින ලදී. තවද ඩබ්. ඩබ්. සී. සී. කුමාර යන දැනට මිය ගොස් සිටින ඉල්ලුම්කරු වෙනුවට ඔහුගේ නීත්‍යානුකූල බිරිඳ ආදේශ කිරීම සඳහා මරණ සහතිකය සහ විවාහ සහතිකයේ සහතික කරන ලද පිටපත් දෙවන පාර්ශ්වයට ඉදිරිපත් කිරීමට අධිකරණයෙන් අවසර ඉල්ලා සිටින ලදී. එහිදී අධිකරණය ප්‍රකාශ කර සිටියේ ඉදිරියේදී යම් ප්‍රදානයක් ලබා දුනහොත් පමණක් එම අවස්ථාවේදී එම ආදේශ කිරීම සලකා බැලිය හැකි බවය. එම නඩු දිනයේ දී දෙපාර්ශ්වය විසින් ප්‍රකාශ කළ කරුණු සහ ඉදිරිපත් කළ ලිඛිත දේශන සැලකිල්ලට ගත් අධිකරණය පළමු පාර්ශ්වය විසින් මීළඟ නඩු දිනයේදී පැමිණිලිකාර සේවකයින් අට දෙනාගේ මුල් පත්වීම් ලිපි ඉදිරිපත් කරන ලෙසත් දෙවන පාර්ශ්වය විසින් අදාළ සේවකයින් අට දෙනා වන්දි විශ්‍රාම ගැන්වීමේදී ඉදිරිපත් කළ ඔවුන්ගේ කැමැත්ත පළ කළ ලිපි සියල්ල ඉදිරිපත් කරන ලෙසත් නියෝග කරන ලදී. මීට අමතරව දෙවන පාර්ශ්වය විසින් තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකා, මුදල් අමාත්‍යතුමාගේ නිර්දේශ සහ අමාත්‍ය මණ්ඩල තීරණයන්හි පිටපත් ඉදිරිපත් කළ දින පිළිවෙළට සකසා අධිකරණයට නැවත ඉදිරිපත් කරන ලෙසත් නියෝග කරන ලදී.

නැවත මෙම නඩුව 2023.05.23 දින කැඳ වූ අතර, එහිදී දෙවන පාර්ශ්වය මෙම නඩුවට අදාළ සේවකයින් අට දෙනාගේ පෞද්ගලික ලිපිගොනු අනුව ඔවුන්ගේ පත්වීම් ලිපිවල සහතික කළ පිටපත් සහ ඔවුන් විසින් වන්දි ලබා ගැනීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලද ලේඛන X ලේඛන ලෙස ලකුණු කිරීමට අධිකරණයෙන් අවසර ඉල්ලා සිටින ලදී. ඒ අනුව අධිකරණයේ අවසරය මත පැමිණිලිකාර සේවකයින් අට දෙනාගේ අදාළ පත්වීම් ලිපිවල සහතික කරන ලද පිටපත් සහ වන්දි ලබා ගැනීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලද ලේඛන වල පිටපත් X ලේඛන ලෙස පිළිවෙළින් ලකුණු කර අධිකරණයට ඉදිරිපත් කරන ලදී.

නමුත් ඒ වන විට පසන් වටවල සහ ඩබ්. එම්. ධර්මසිරි මහතුන් අවුරුදු 55 ඉක්මවා ගොස් සිටින බැවින් වන්දි ලබා ගැනීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලද ලේඛන වලට අත්සන් නොකළ බවට දෙවන පාර්ශ්වය ප්‍රකාශ කරන ලදී. එලෙසම තේ ශක්ති අරමුදල 2000 වර්ෂයේ ආරම්භ කර 2016 වසරේ ප්‍රතිව්‍යුහගත කරණය කර සේවකයින් අනිවාර්ය විශ්‍රාම ගන්වන තෙක් ආයතනයේ සියලුම සේවකයින්ගේ සාමාන්‍ය විශ්‍රාම ගන්වන වයස අවුරුදු 60 බවට දෙවන පාර්ශ්වය විසින් පිළිගන්නා ලදී. රාජ්‍ය ව්‍යවසායන්හි අතිරික්ත සේවකයින් සඳහා වන ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය මැයින් වැඩ බලන භාණ්ඩාගාර ලේකම් විසින් 2016.03.08 දාතමින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක 2/2016 අනුව වෛකල්පිත විශ්‍රාම යාමේ වයස අවුරුදු 55ක් ලෙස සැළකිය යුතු බව රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස කැබිනට් මණ්ඩලය තීරණය කර ඇති බැවින් තේ ශක්ති අරමුදලේ සේවය කළ අවුරුදු 50ට හෝ ඊට අඩු සේවකයින්ට වන්දි ගණනය ඒ ආකාරයෙනුත් වයස අවුරුදු 55 දක්වා සේවය කර ඇති සේවකයින් 2016 දෙසැම්බර් මස 13 වෙනිදා ගත් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වන්දි ගණනය කිරීම අනුව සිදු කර ඇති බවට තහවුරු වී ඇති හෙයින් මෙම අවස්ථාවේදී පැමිණිලිකාර පාර්ශ්වයට අයත්

01. එම්. ජී. නීතා රත්නකුමාරි
02. එම්.කේ. අනුර සරත් කුමාර

03. ප්‍රියන්ත බාලපටබැඳි
04. ඩබ්. ඩබ්. සී. සී. කුමාර

යන සේවකයින්ට තවදුරටත් කිසියම් සහනයක් නිර්දේශ කිරීමට හැකියාවක් නොමැති බවට අධිකරණයට නිරීක්ෂණය වේ. දීර්ඝ කාලයක් පුරාවට ඇදී ආ මෙම නඩුවේ තීන්දුව ලබන නඩු දිනයේ දී ප්‍රකාශයට පත් කිරීමට පෙර දෙපාර්ශ්වයටම අවසන් ලිඛිත දේශන සැළකිරීම් ඉදිරිපත් කිරීමට සති තුනක කාලයක් ලබා දෙන ලද අතර ඒ අනුව 2023.06.20 දිනට පෙර දෙපාර්ශ්වය විසින්ම අදාළ ලිඛිත දේශන ගොනු කරන ලෙස අධිකරණය නියෝග කරන ලදී. තවද අධිකරණය විසින් දෙවන පාර්ශ්වයෙන් ඉල්ලා සිටින ලද්දේ අංක 01/2013 රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛය අනුව අවුරුදු 55 සම්පූර්ණ වූ සේවකයින් විශ්‍රාම ගැන්වීමේ දී එම චක්‍ර ලේඛය අනුව මාස හයක පෙර දැනුම්දීමක් කර තිබේද යන්න ගැන ලිඛිත තොරතුරු ඉදිරිපත් කරන ලෙසයි.

මෙම නඩුව 2023.07.07 දින නැවත කැඳ වූ අවස්ථාවේදී දෙවන පාර්ශ්වය විසින් තම අවසන් ලිඛිත දේශන සැළකිරීම් ඉදිරිපත් කර තිබූ අතර පළමු පාර්ශ්වය කිසිදු අවසන් ලිඛිත දේශනයක් ඉදිරිපත් නොකරන බවට ප්‍රකාශ කර සිටින ලදී.

2016.12.31 දිනෙන් අවසන්ව තේ ශක්ති අරමුදලේ සේවකයන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ යෝජනාවලිය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් තීරණ ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

i. වයස අවුරුදු 55 වෛකල්පිත විශ්‍රාම යාමේ වයස ලෙස සලකා රාජ්‍ය ව්‍යාපාර අංක 02/2016 අනුව තේ ශක්ති අරමුදලේ සේවය කළ වයස අවුරුදු 55ට අඩු සේවකයින්ට වන්දි ගණනය කර අනිවාර්ය විශ්‍රාම ගැන්වීම.

ii. තේ ශක්ති අරමුදලෙහි සේවය කළ වයස අවුරුදු 55ට වැඩි සේවකයින් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2013 අනුව විශ්‍රාම ගැන්වීම.

තවදුරටත් මෙහිදී නිරීක්ෂණය වන්නේ රාජ්‍ය ව්‍යාපාර අංක 01/2013 අනුව වන්දි මුදලක් ලබා දී සේවකයින් විශ්‍රාම ගැන්වීමක් ගැන කිසිදු සඳහනක් නොමැති බවයි. තවද එම චක්‍රලේඛය අනුව කිසියම් රාජ්‍ය නිලධාරියෙකු වයස අවුරුදු 55 ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම් සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස වන අවුරුදු 60 දක්වා සේවයේ රැඳී සිටිය හැකි බවද නිරීක්ෂණය වේ. මීට අමතරව අවුරුදු 55 සිට අවුරුදු 60 අතර කාලපරිච්ඡේදය තුල යම් නිලධාරියෙකු තම අභිමතය පරිදි පත්වීම් බලධාරියා වෙත මාස තුනක පූර්ව දැනුම්දීමක් කිරීමෙන් අනතුරුව විශ්‍රාම යා හැකිය. එමෙන්ම අවුරුදු 55ට වැඩි යම් නිලධාරියෙකුට තම කාර්යක්ෂමතාවය හා කාර්ය සාධනය සතුටුදායක නොවන්නේ නම්, මාස හයක පූර්ව දැනුම්දීමකින් පසුව විශ්‍රාම ගැන්වීමේ බලය පත්වීම් බලධාරියා සතු වන බවත් නිරීක්ෂණය වේ. එම නිසා රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක 01/2013 අනුව විශ්‍රාම යන කිසිදු රාජ්‍ය සේවකයෙකුට වන්දියක් හිමි නොවේ.

වග උත්තරකාර පාර්ශ්වය වන තේ ශක්ති අරමුදල සිය සේවකයින්ගෙන් විශ්‍රාම යෑම සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලේඛනවලට 2016 අප්‍රේල් මාසයේදී අත්සන් ලබා ගෙන ඇත්තේ සිය කැමැත්තෙන් වන්දි ලබා ගැනීමේ ලේඛනයකට මිස අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ ලේඛනයකට නොවන බව ඉදිරිපත් කළ ලේඛන අනුව පැහැදිලිව පෙනී යයි.

තවද අදාළ වකවානුව තුලම අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මගින් තම සේවකයින් සිය කැමැත්තෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රියාපටිපාටියක් හඳුන්වා දුන් රාජ්‍ය ව්‍යාපාරයක් වූ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ප්‍රධාන මානව සම්පත් කළමනාකාර විසින් 2016.05.31 දාතමින්, 2016 අංක 01 දරන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණ කොට්ඨාස චක්‍ර ලේඛය අනුව වයස අවුරුදු 55 සිට වයස අවුරුදු 59 දක්වා සේවයේ යෙදී සිටි සේවකයින් සඳහා අවසාන වශයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ලබා ගත් සියළුම දීමනාවන් ඇතුළු මාස 06ක වැටුපක් වන්දි වශයෙන් ගෙවා ඇති බව ද නිරීක්ෂණය වේ.

### ප්‍රදානය

මෙම බේරුම්කරණ නඩුවට අදාළව දෙපාර්ශ්වයම එකඟත්වයෙන් එළඹි සමථ යෝජනාව අනුව පළමු පාර්ශ්වය වන ජයන්ත තිරාණගම මයා ඇතුළු සේවක පිරිස විසින් ඉල්ලා ඇති 2016.12.31 දින සිට සේවය අවසන් කිරීමේදී වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව තිබියදී විශ්‍රාම යැවීමේ වයස අවුරුදු 55 ලෙස සලකා වන්දි ගණනය කිරීම මගින් අසාධාරණයක් සිදු වී තිබේද? එසේ සිදු වී තිබේ නම් ඔවුනට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳ සලකා බැලීමේදී

01. රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක 02/2016 අනුව සහ අමාත්‍ය මණ්ඩල තීරණ අනුව අවුරුදු 55ට අඩු සේවකයින් විශ්‍රාම ගැන්වීමේදී රජයේ අනුමත නියමිත ක්‍රමවේදය අනුව එම සේවකයින් විශ්‍රාම ගන්වා ඇති බවට පැහැදිලි වන හෙයින්,

i. එම්. පී. නීතා රත්න කුමාරි
ii. එම්. කේ. අනුර සරත් කුමාර

iii. ප්‍රියන්ත බාලපටබැඳි
iv. ඩබ්. ඩබ්. සී. සී. කුමාර

යන සේවකයින් හට කිසිදු අසාධාරණයක් සිදු වී නොමැති බවටත් තේ ශක්ති අරමුදල සිය සේවකයින් හට වන්දි ගණනය කළ දිනය වන 2016.12.31 වන දින වන විට වයස අවුරුදු 55 ඉක්මවා තිබූ සේවකයින් වන,

i. ජයන්ත තිරාණගම
ii. ඒ.ඩබ්. කුමාරසිරි
iii. පසන් වටවල
iv. ඩබ්. එම්. ධර්මසිරි

යන අයට 01/2013 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව විශ්‍රාම ගැන්වීමේදී කිසිදු වන්දි මුදලක් හිමි නොවූ අතර එම වකවානුව තුලදීම සිය කැමැත්තෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් කැබිනට් අනුමැතියකින් ක්‍රියාත්මක කළ රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය සිය සේවකයින් හට වන්දි මුදල් ගණනය කිරීමේදී අවුරුදු 55 සිට අවුරුදු 59 දක්වා කාල පරිච්ජේදය තුළ සේවය කළ සේවකයන් හට අවසාන වශයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ලබා ගත් සියලු දීමනාවන් ඇතුළු මාස 06ක වැටුප වන්දි වශයෙන් ලබා දී ඇති හෙයින්, ඉහත නම් සඳහන් සේවකයින් හතර දෙනාට අසාධාරණයක් සිදු වී ඇති බවත් එම සේවකයින් හතර දෙනාට, ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලය මඟින් ලබා දුන් පරිදි මාස හයක සියලු දීමනා සහිත අවසාන වැටුප වන්දියක් ලෙස ගෙවන ලෙස නියෝග කරමි. ඒ අනුව

| | | | | |
|---|---|---|---|---|
| ජයන්ත තිරාණගම | - | රු. 19219 × 6 | = | රු. 115,314/- |
| ඒ. ඩබ්. කුමාරසිරි | - | රු. 31190.50 × 6 | = | රු. 187,143/- |
| පසන් වටවල | - | රු. 35518 × 6 | = | රු. 213,108/- |
| ඩබ්. එම්. ධර්මසිරි | - | රු. 23950 × 6 | = | රු. 143,700/- |

ඒ අනුව මුළු මුදල ලෙස රු. 659,265/- (හය ලක්ෂ පනස් නව දහස් දෙසිය හැට පහ) මෙම ප්‍රදානය ගැසට් කළ දින සිට මසක් ඇතුළත නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙස දෙවන පාර්ශ්වය වන තේ ශක්ති අරමුදල වෙත නියෝග කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

රමාල් අයි සිරිවර්ධන,
බේරුම්කරු.

2023 අගෝස්තු මස 10 වැනි දින,

EOG 09-0066

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.